සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2021 ජනවාරි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2021-03-21
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) ***ආදායම් බදු සඳහා 2017 අංක 24 දරණ ආදායම් බදු පනතේ විධිවිධාන නොවෙනස්ව 2019/20 තක්සේරු වර්ෂය මුළුල්ලේම සංශෝධන නොමැතිව එලෙසම පැවති බව උපකල්පනය කරන්න.***

(8) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**ගිහාන්** ශ්‍රී ලංකාවේ පුරවැසියෙකි. ඔහුගේ දියණියගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ඔහු 2019 අගෝස්තු 20 දින කැනඩාවට සංක්‍රමණය වූයේය. කෙසේවෙතත්, දියණියගේ විශ්ව විද්‍යාල නිවාඩුව හේතුවෙන් ඔහු 2020 මාර්තු 15 දින නැවත ශ්‍රී ලංකාවට පැමිණි අතර, 2020 මාර්තු 31 දින ශ්‍රී ලංකාවෙන් නැවත පිටත්ව ගියේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව, 2019/20 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ආදායම් බදු අරමුණු සඳහා **ගිහාන්ගේ** වාසික තත්ත්වය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

කාර්තුමය වාරික වශයෙන් ආදායම් බදු ගෙවන වාසික තැනැත්තෙකු එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද කාර්තුමය වශයෙන් ගණනය කිරීම අවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කාර්තුමය වාරික ගෙවීම් සඳහා නියමිත දින **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) පැහැර හරින ලද බද්දක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

බද්දට යටත් සැපයුම්වල වටිනාකම එකතුකළ අගය මත බද්ද සඳහා යටත්වන සීමාව (threshold) නොඉක්මවීම නිසා **සීමාසහිත සැම්ස් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමෙහි** එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචිය 2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන, භාණ්ඩ සහ සේවා සැපයුම්කරුවන් මත එකතු කළ අගය මත බද්දට යටත්වන වර්ෂයක සීමාව (threshold) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිය අවලංගු කිරීම මත **සීමාසහිත සැම්ස් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** වගකීම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

**සීමාසහිත X සමාගම,** ඖෂධ ව්‍යාපාරයක නියැලී සිටියි. 2020 ජනවාරි මාසයේදී සොරකම් කිරීම නිසා මුදලින් රු.600,000/- ක අලාභයක්, සමාගමට දැරීමට සිදුවිය. පසුව පොලිසිය විසින් රු.100,000/- ක මුදලක් සොයාගත් අතර, 2020 මාර්තු මාසයේදී රු.200,000/- ක වන්දි මුදලක් රක්ෂණ සමාගමෙන් ලැබුණි. සමාගම, රු.300,000/- ක ශුද්ධ අලාභය ආදායම් බදු වගකීම ගණනය කිරීමේදී ඉඩදෙන වියදමක් වශයෙන් අඩුකරගෙන තිබුණි. නමුත්, සහකාර කොමසාරිස්වරයා එම මුදල සඳහා ඉඩදී නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

*"සීමාසහිත හේලි සහ සමාගමට එදිරිව ආදායම් බදු කොමසාරිස්" (Heyley & Co. Ltd. Vs CIR)* නඩු තීන්දුවේ තීරණය මත පදනම්ව රු.300,000/- ක ශුද්ධ අලාභය, බදු අරමුණු සඳහා ඉඩදෙන වියදමක් ලෙස සැලකිය හැකිදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# **B කොටස**

(මුළු ලකුණු 30)

## **05** වන ප්‍රශ්නය

නිවසේ සාදන ලද කුළු බඩු දිවයින පුරා බෙදාහැරීම සඳහා **රවී** සහ ඔහුගේ මිතුරා වන **දිලුම්** විසින් **හැපි ඩීල්ස්** නමැති හවුල් ව්‍යාපාරය ආරම්භ කරන ලදි. **රවී** සහ **දිලුම්** ලාභා'ලාභ සමසමව බෙදා ගැනීමට එකඟ වී තිබේ. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.1,850,000/- ක් විය.

හවුල් ව්‍යාපාරයේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

(1) ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර තිබේ:

| | **රු.** |
|---|---:|
| වැටුප් සහ වේතන (හවුල්කරුවන්ගේ වැටුප් ද සහිතව) | 5,700,000 |
| වාහන කුලී ගාස්තු | 960,000 |
| ක්ෂය - බෙදාහැරීමේ ලොරි රථය (2018/19 දී අත්පත් කරගත්) | 420,000 |
| කුලිය | 240,000 |

(2) **රවී** සහ **දිලුම්** පිළිවෙලින් රු.80,000/- ක් සහ රු.100,000/- ක් බැගින් මාසිකව වැටුප් ලබාගෙන තිබේ.

(3) **දිලුම්** ට අයත් ගොඩනැගිල්ලක ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන අතර, මාසිකව රු.20,000/- බැගින් වූ කුලියක් ඔහුට ගෙවා තිබේ.

(4) පාරිභෝගිකයන්ට කුළු බඩු බෙදාහැරීම සඳහා වාහන කුලී ගාස්තු ගෙවා තිබේ.

(5) බෙදාහැරීමේ ලොරි රථය ද කුළුබඩු බෙදාහැරීමට යොදාගන්නා අතර, එහි පිරිවැය රු.3,000,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019/20 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) බදු අරමුණු සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම. (ලකුණු 03)

(b) හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු රඳවාගැනීමේ බද්ද. (ලකුණු 02)

(c) එක් එක් හවුල්කරුගේ හවුල් ව්‍යාපාරයේ ආදායම් කොටස. (ලකුණු 03)

(d) එක් එක් හවුල්කරුට හිමි රඳවාගැනීමේ බදු බැර කොටස. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත ගයා ට්‍රේඩිං (පෞද්ගලික) සමාගම,** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමකි. සමාගම, 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව තවමත් ඉදිරිපත් කර නොතිබුණි. සහකාර කොමසාරිස්වරයා ඔහුගේ විනිශ්චය මත පදනම් වෙමින් තක්සේරුවක් නිකුත් කර තිබෙන අතර, තක්සේරු දැන්වීමේ දිනය වන්නේ 2020 ජුනි 30 වේ. ඔබ, **සීමාසහිත ගයා ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** බදු උපදේශකවරයා වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) තක්සේරු දැන්වීමක ඇතුළත් විය යුතු අයිතම හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(B) **සරත්,** වාසික තැනැත්තෙකි. 2016 දෙසැම්බර් 01 දින රු. මිලියන 36 ක පිරිවැයකට හොරණ ප්‍රදේශයෙන් මිලදී ගත් අක්කර 1 ක ඉඩමක් ඔහු සතු වේ. ඔහු 2019 ජුනි 30 දින මෙම ඉඩම රු. මිලියන 48 කට විකුණන ලද අතර, රු.130,000/- ක් තැරව්කාර ගාස්තු වශයෙන් ගෙවන ලදී. 2017 සැප්තැම්බර් 30 දිනට මෙම ඉඩමේ වෙළෙඳපොළ වටිනාකම රු. මිලියන 40 ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගනුදෙනුව මත ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත කුෂ්බූ ෆ්ලවර්ස් සමාගම,** සැරසිලි කර්මාන්තයේ නිරත වන, එකතු කළ අගය මත බද්ද (VAT) සඳහා ලියාපදිංචි සමාගමකි. සමාගම, ඔවුන්ගේම මල් ගොවිපොළක් නුවරඑළියේ පවත්වාගෙන යනු ලබයි. පහත සඳහන් තොරතුරු 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් උපුටාගෙන තිබේ:

(1) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී විකුණුම් පිළිබඳ විස්තර පහත දැක්වේ:
[එකතු කළ අගය මත බදු (VAT) රහිතව]:

| | **රු.** |
|---|---|
| සේවා සැපයීමෙන් ලද ආදායම | 85,750,000 |
| මල් විකිණීමෙන් ලද ආදායම | 12,250,000 |

(2) කාර්තුව තුළදී සමාගම පහත සඳහන් යෙදවුම් බදු ගෙවා තිබේ:

| | **රු.** |
|---|---|
| මල් ගොවිපොළට සම්බන්ධ වියදම් මත | 163,500 |
| සැරසිලි අමුද්‍රව්‍ය මිලදී ගැනීම මත | 3,435,000 |
| ව්‍යාපාර දෙකටම පොදු වියදම් මත | 448,000 |

(3) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද රු.160,000/- කි.

(4) මාසික එකතු කළ අගය මත බදු වාරික වශයෙන් සමාගම, රු.2,000,000/- ක් ගෙවා තිබේ.

(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 8% ක් ලෙස සළකන්න.)

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ශ්‍රී ප්‍රොඩක්ට්ස් (පෞද්ගලික) සමාගම,** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2019 ජනවාරි 01 වන දින, සංස්ථාපනය කරන ලද අතර, එදිනම ව්‍යාපාර කටයුතු අරඹන ලදී. එය, ළදරු ඇඳුම් නිෂ්පාදනය කර අපනයනය කිරීමේ නිරතව සිටියි.

පහත සඳහන් තොරතුරු, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත ශ්‍රී ප්‍රොඩක්ට්ස් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගෙන තිබේ:

(1) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සියලු වියදම් අඩුකිරීමෙන් සහ සියලුම ආදායම් බැර කිරීමෙන් පසු බද්දට පෙර ශුද්ධ ලාභය රු.33,650,000/- කි. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මුළු පිරිවැටුම රු.634,400,000/- කි.

(2) වෙනත් ආදායම් විස්තර:

| | රු. |
|---|---|
| ලාභාංශ ආදායම - රඳවා ගැනීමේ බදු (WHT) අඩු කළ පසු | 301,000 |
| යන්ත්‍ර විකිණීමෙන් ලද ලාභය | 168,000 |
| | **469,000** |

(3) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:

**පිරිවැය**

| වත්කම් | 2019 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.) | එකතු කිරීම් (රු.) | ඉවත්කිරීම් (රු.) | 2020 මාර්තු 31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| ඉඩම | 8,000,000 | - | - | 8,000,000 |
| ගොඩනැගිලි | 10,000,000 | - | - | 10,000,000 |
| යන්ත්‍ර | 8,210,000 | | 2,460,000 | 5,750,000 |
| මෝටර් ලොරි රථ | 2,465,000 | 1,350,000 | - | 3,815,000 |
| කාර්යාල උපකරණ | 867,000 | - | - | 867,000 |
| පරිගණක | 1,850,000 | - | - | 1,850,000 |
| පරිගණක මෘදුකාංග | - | 1,200,000 | - | 1,200,000 |
| | **31,392,000** | **2,550,000** | **2,460,000** | **31,482,000** |

- 2017/18 තක්සේරු වර්ෂය තුළදී රු.2,460,000/- ක පිරිවැයකට මිලට ගත් යන්ත්‍රයක් අඛණ්ඩව සිදුවූ තාක්ෂණික දෝෂ හේතුවෙන් 2019 ජූනි මාසයේදී රු.750,000/- කට විකුණන ලදී.
- වසර 4 ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ 2019 මැයි මස 01 දින මෝටර් ලොරි රථයක් අත්පත් කරගන්නා ලදී. මාසික කල්බදු වාරිකය රු.34,000/- ක් වන අතර, වර්ෂය තුළදී වාරික 11 ක් ගෙවා තිබුණි.
- සමාගම විසින් වර්ෂය තුළදී රු. මිලියන 1.2 කට පරිගණක මෘදුකාංගයක් අත්පත් කරගෙන ඇත. සමාගම, එහි ඵලදායී ජීව කාලය වසර 10 ක් ලෙස තක්සේරු කර තිබේ.
- විකුණූ යන්ත්‍රය හැර අනෙකුත් සියලුම වත්කම් අත්පත් කරගෙන ඇත්තේ 2018/19 තක්සේරු වර්ෂය තුළදීය.

(4) පරිපාලන වියදම් තුළ පහත සඳහන් ඒවා ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.6,242,000/- කි.
- සමාගම, අවතැන් වූ වැඩිහිටියන් සඳහා නිවාසයක් පවත්වාගෙන යන අනුමත පුණ්‍යායතනයකට රු.1,000,000/- ක් පරිත්‍යාග කර තිබේ.
- තවද, කොවිඩ්-19 (COVID-19) රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා රු.1,000,000/- ක් වටිනා වෛද්‍ය උපකරණ IDH රෝහලට (රජයේ රෝහලකි) පරිත්‍යාග කර තිබේ.
- 2019/20 තක්සේරු වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.1,563,000/- කි.

(5) බෙදාහැරීමේ වියදම් තුළ පහත සඳහන් ඒවා ඇතුළත් වේ:

- සංග්‍රහ වියදම් රු.234,000/- ක් වූ අතර, එය ව්‍යාපාර ගනුදෙනු සඳහා පැමිණි පාරිභෝගිකයන්ට සංග්‍රහ කිරීම සඳහා දරා තිබේ.
- විදේශ මාධ්‍යයන්හි ප්‍රචාරණ වියදම් වශයෙන් සමාගම, රු.1,450,000/- ක් දරා තිබේ.
- විදේශ සැපයුම්කරුවන් හමුවීම වෙනුවෙන් අධ්‍යක්ෂකගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් රු.800,000/- ක් දරා තිබේ.

(6) වර්ෂය තුළදී ලබාගත් මූල්‍ය කල්බද්ද සඳහා ගෙවන ලද කල්බදු පොලිය වන රු.196,000/- ක් මූල්‍ය වියදම්වල ඇතුළත් වේ.

(7) පහත සඳහන් තොරතුරු ද සපයා තිබේ:

- ප්‍රවර්තන වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු [Economic Service Charge (ESC)] වශයෙන් රු.1,180,000/- ක් සමාගම ගෙවා තිබේ.
- 2019/20 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.5,000,000/- ක් සමාගම ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019/20 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත ශ්‍රී ප්‍රොඩක්ට්ස් (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම.

(b) බදු අයකළ හැකි ආදායම.

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද.

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

***(සැ.යු: යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.)*** (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වාසික තැනැත්තෙකු වන **ගාමිණී**, වෘත්තියෙන් නීතිඥවරයෙකි. ඔහු ශ්‍රී ලංකාවේ මූල්‍ය සමාගමක නීති නිලධාරියෙකු ලෙස සේවය කරයි.

2019/20 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **ගාමිණී** සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) සේවා නියුක්තියෙන් ලද ආදායම:

- දළ වැටුප - මාසිකව රු.325,000/- ක් බැගින්.
- ගමන් වියදම් දීමනාව - මාසිකව රු.50,000/- බැගින්.
- පෙර වර්ෂයේ ලාභවලින් 2019 අප්‍රේල් මාසයේදී ලද ප්‍රසාද දීමනාව රු.300,000/- කි.
- 2019 මැයි මාසයේදී, ජාත්‍යන්තර වැඩමුළුවක් සඳහා සමාගම නියෝජනය කිරීමට ඔහුව ඉන්දියාවට යවන ලදී. එම ගමනේ පිරිවැය රු.120,000/- ක් වූ අතර, එය සමාගම මඟින් ප්‍රතිපූරණය කරන ලදී.
- ඔහු කුලියට ගත් නිවසක ජීවත්වන අතර, මාසික කුලිය වන රු.35,000/-, සේවා යෝජකයා විසින් ප්‍රතිපූරණය කරනු ලැබේ.
- වර්ෂය සඳහා අඩු කරන ලද උපයන විට ගෙවීමේ බද්ද (PAYE) රු.604,800/- කි.

(2) **ගාමිණී** විසින් උපදේශන සේවා සපයන ඔහුගේම ව්‍යාපාරයක් 2019 අප්‍රේල් 01 දින ආරම්භ කළේය. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද ආදායම් සහ වියදම් ගිණුමේ සාරාංශය පහත දැක්වේ:

| | **රු.** | | **රු.** |
|---|---|---|---|
| සේවක වැටුප් | 225,000 | ආදායම | 2,844,000 |
| විදුලි හා ජල බිල්පත් | 27,000 | | |
| ක්ෂය | 126,000 | | |
| වෙනත් වියදම් | 143,000 | | |
| ශුද්ධ ලාභය | 2,323,000 | | |
| | **2,844,000** | | **2,844,000** |

- 2020 ජනවාරි මාසයේදී රු.400,000/- ක කාර්යාල උපකරණ ව්‍යාපාරය සඳහා මිලදී ගත්තේය. ප්‍රාග්ධන දීමනා ඉල්ලා සිටිය හැකි වෙනත් සුදුසුකම් ලබන වත්කම් කිසිවක් එහි නොවීය.
- අනෙකුත් සියලු වියදම් බදු කටයුතු සඳහා ඉඩදිය හැකි වියදම් වේ.

(3) **ගාමිණී,** කොළඹ පිහිටි කුලී නිවසක වාසය කරයි. ඔහුට අයත් රත්නපුර පිහිටා ඇති නිවස මාසයකට රු.25,000/- බැගින් පවුලකට කුලියට දී තිබේ.

(4) **ගාමිණීට** වාණිජ බැංකුවක ස්ථාවර තැන්පතුවක් තිබෙන අතර, මෙම තැන්පතුව මත වර්ෂය සඳහා පොලිය රු.132,000/- කි. බැංකුව විසින් පොලිය මත රඳවා ගැනීමේ බදු අඩුකරගෙන තිබේ.

(5) **ගාමිණී,** 2018 ජූලි 01 දින රු. මිලියන 5 ක පිරිවැයකට ලැයිස්තුගත පොදු සමාගමක කොටස් මිලට ගත්තේය. ඔහු මෙම කොටස් 2019 මැයි මාසයේදී රු. මිලියන 6 කට විකුණුවේය. 2019 අප්‍රේල් මාසයේදී ඔහුට රු.243,000/- ක ශුද්ධ ලාභාංශයක් ලැබී තිබේ.

(6) වර්ෂය තුළදී **ගාමිණී** රු.500,000/- ක උපකරණ සෞඛ්‍ය අමාත්‍යාංශයට පරිත්‍යාග කර තිබේ.

(7) **ගාමිණී,** 2019/20 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු ගෙවීම් වශයෙන් රු.100,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019/20 තක්සේරු වර්ෂය සඳහා **ගාමිණීගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම.

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද.

(c) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

(d) බදු නිදහස් ආදායම, (වේ නම්). (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

<u>**කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව**</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |